**පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව.**
**කුරුණෑගල දිස්ත්‍රික්කය.**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දින ද විස්තරාත්මක කලමනාකරණ වාර්තාව 2019 ජූනි 15 දින ද සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ භාණ්ඩ අයිතම 12 ක් හා ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් ඉඩම් 7 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2019.12.31 දිනට සිදුකරන භාණ්ඩ සමීක්ෂණය තුළින් වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කිරීම හා ඉඩම් වටිනාකම් තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත් කර ඒ තුළින් හඳුනාගන්නා ලද පිරිවැය මූල්‍ය ප්‍රකාශ තුළින් ගිණුම්ගත කිරීමටත් කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ගිණුමේ රු. 3,391,498 ක ශේෂය තුළ 2016, 2017 හා 2018 වර්ෂ සඳහා යෙදවුම් බදු ලෙස හිලව් කළ යුතු රු. 3,248,621 ක ශේෂයක් ඇතුළත්ව තිබුණි. | වර්ෂයේ එකතු කළ අගය මත බදු ලැබීම් වලින් හිලව් කිරීම් සිදුකර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි යෙදවුම් බදු ලෙස හිලව් කළ යුතු රු.3,248,621 න් ශේෂයක් ගෙවිය යුතු එකතු කළ අගය මත බදු ගිණුමේ පවතින බව පිළිගනිමි. |
| (ඇ) | වටිනාකම රු. 103,961,321 ක් වූ ඉඩම් 09 කට හා ගොඩනැගිලි 42 කට අදාළව ඔප්පු, මිනින්දෝරු | මූල්‍ය ප්‍රකාශන වල සඳහන් වටිනාකම් තහවුරු කර ගැනීමට | ගොඩනැගිලි 42 ක ඔප්පු/ මිනින්දෝරු සහතික/ පැවරුම් සහතික පිළිබඳ අප පළාත් |

| | | |
|---|---|---|
| සැලැස්ම, පැවරුම් සහතික හා වටිනාකම තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | පාලන ආයතනය සතුව තොරතුරු සොයාගැනීමට අපහසු බැවින් අදාළ ආයතන සමඟ විමසීම් කර අදාළ ඔප්පු හා පැවරුම් සහතික සකස් කර ගැනීමට පියවර ගන්නා බව දන්වමි. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵලය**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 50,339,638 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,420,109 ක් විය.

**2.2** **මූල්‍ය පාලනය**

-------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලදී ලියා අත්සන් කරන ලද රු.313,068 ක් වටිනා චෙක්පත් 11 ක් 2019 පෙබරවාරි 01 දින වන විටත් අත රඳවාගෙන තිබුණි. | මු.රෙ.386 (4) ප්‍රකාරව චෙක්පතක වලංගු කාල සීමාව දින 30 කට සීමා කළ යුතු වුවද එම කාල සීමාව ඉක්මවීමට පෙර ආදායකයාට ලබා දීමට කටයුතු කළ යුතුවේ. | මේ සම්බන්ධයෙන් අදාළ විෂය නිලධාරියා වෙත තරයේ අවවාද ලබාදුන් අතර මේ වනවිට එම වරද නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | රු.954,981 ක් වටිනා චෙක්පත් 10 ක් ආදායකයින් වෙත භාර දීමේදී චෙක්පත් භාරදීමේ ලේඛනයේ අත්සන් ලබාගෙන නොතිබුණි. | මු.රෙ. 389 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | චෙක්පත් 10ක් අදාළ ආදායකයින් වෙත නිකුත් කිරීමේ දී චෙක්පත් නිකුත් කිරීමේ ලේඛනයේ චෙක්පත් භාරදුන් බවට අත්සන් ලබාගෙන නොමැති බව පිළිගනිමි. |

**2.3** **ආදායම් පරිපාලනය**

**2.3.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| ආදායම් ප්‍රභවය | වර්ෂය 2018 ඇස්තමේන්තුගත ආදායම් | වර්ෂය 2018 බිල්කළ ආදායම් | වර්ෂය 2018 රැස්කළ ආදායම් | වර්ෂය 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | වර්ෂය 2017 ඇස්තමේන්තුගත ආදායම | වර්ෂය 2017 බිල්කළ ආදායම් | වර්ෂය 2017 රැස්කළ ආදායම් | වර්ෂය 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. | රු000. |
| I. වරිපනම් හා බදු | 3,724 | 3,581 | 3,512 | 96 | 3,424 | 1,789 | 3,777 | 156 |
| II. බදු කුලී | 22,415 | 20,740 | 20,842 | 18 | 22,442 | 13,444 | 24,439 | 99 |
| III. බලපත්‍ර ගාස්තු | 1,105 | 1,264 | 1,270 | - | 1,108 | 1,041 | 1,306 | 6 |
| V. වෙනත් ආදායම් | 119,365 | 130,182 | 107,765 | 77,058 | 111,084 | 84,219 | 91,758 | 50,036 |
| එකතුව | 146,609 | 155,767 | 133,389 | 77,172 | 138,058 | 100,493 | 121,280 | 50,297 |

**2.3.2.** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.12,510,843 ක් හා මුද්දර ගාස්තු රු.54,245,325 ක් විය. | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු උසාවි දඩ හා ලැබිය යුතු මුද්දර ගාස්තු පැවති බව පිළිගනිමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 3.1 කාර්යය සාධනය

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**තිරසර සංවර්ධන ඉලක්ක**

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත් වී තිබුණු අතර තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක 06 ක් වර්ෂයේ හඳුනාගෙන තිරසර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා සභාව විසින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණි. | වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීමේ දී තිරසර සංවර්ධන අරමුණු කෙරෙහි අවධානය යොමු කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030 යටතේ හඳුනාගත් ඉලක්ක හා අරමුණු ඉටු කරගැනීම හා ඒ හරහා බල ප්‍රදේශයේ සංවර්ධනය නඟා සිටුවීමට විවිධ ව්‍යාපෘතීන් සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කළ බව පිළිගනිමි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ජල ගාස්තුව රු. 618,131 ක් වූ අතර එයින් රු. 153,466 ක් කපා හැරීම සඳහා සභා තීරණයක් ගෙන තිබුණි. | හිඟ ජල ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | මෙම හිඟයෙන් අයකරගත නොහැකි රු.153,466 ක හිඟ ශේෂය කපා හැරීම සඳහා සභා තීරණයක් ගෙන ජල ගාස්තු කපා හැරීමේ ක්‍රියාවලිය සඳහා විෂයභාර අමාත්‍යතුමා වෙත යොමු කර ඇති බව දන්වා සිටිමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| විවිධ හේතු මත දීර්ඝ කාලයක සිට අය නොවන සේවකයින් 22කට අදාළ සේවක ණය රු. 361,528 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිග සේවක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සේවකයින් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.207,163.06 ක මුදල විශ්‍රාම පාරිතෝෂිකයෙන් අය කර ගැනීම සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දන්වා ලිපි යොමු කර ඇති බවත්, ඉතිරි අය නොවන සේවක ණය ශේෂය වන රු.154,364.94 ක මුදල සඳහා සාධාරණීකරණ කමිටුව මඟින් ඉදිරි කටයුතු සිදු කෙරෙමින් පවතින බවත් දන්වා සිටිමි. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කඹුරාපොළ වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 08 ක් වසා තිබුණි. කඩ කාමර 04 ක් භාවිතා නොකරන අතර, කඩ කාමර 05 ක පිටුපස කොටසේ ඉදිකිරීම් සිදුකර පදිංචිය සඳහා භාවිතා කරමින් පැවතුණද සභාව ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | කඩ කාමර පූර්ණ උපයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | පඩුවස්නුවර ප්‍රාදේශීය සභාවට අයත් කඹුරාපොල වෙළඳ සංකීර්ණය ගැටළු සහගත තත්ත්වක් පවතින වෙළඳ සංකීර්ණයකි . දෛනිකව මෙහි වෙළඳාම හෝ ව්‍යාපාර කටයුතු සඳහා විවෘතව පවතින්නේ කඩ කාමර කිහිපයක් බව පිළිගනිමි. |